# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති (සංශෝධන)

**2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය විසින් 2026 අප්‍රේල් මස 09 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2026 මාර්තු මස 11 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[59 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

**මිල : රු. 101.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනතේ පොදු සංශෝධනයක් සිදු කරනු ලබන අතර, එම සංශෝධනයේ නීතිය බලපෑම වනුයේ ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති වරද සිදු කිරීම සම්බන්ධයෙන් සපයනු ලැබිය හැකි හෝ එකතු කරනු ලැබිය හැකි "වෙනත් වත්කම්" ද සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ විධිවිධාන අදාළ වීම දීර්ඝ කිරීම වේ.

***3 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 2අ වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ ප්‍රධාන ප්‍රඥප්තියේ විධිවිධාන අදාළ වීම පුළුල් කිරීම වේ.

***4 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ එම වගන්තියේ නිශ්චිතව දක්වා ඇති වැරදිවල විෂය පථය පුළුල් කිරීම වේ.

***5 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ ක්‍රියා විරහිත කිරීමේ නියෝගයක් බලපැවැත්විය යුතු කාලසීමාව දීර්ඝ කිරීම වේ.

***6 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 4අ වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ -

(අ) ක්‍රියා විරහිත කිරීමේ නියෝගයක් තහවුරු කිරීම සඳහා මහාධිකරණය වෙත ඒකපාර්ශ්වික ඉල්ලීමක් ඉදිරිපත් කිරීම සඳහා පොලිස් නිලධරයකු වෙත ලබා දෙන කාලසීමාව දීර්ඝ කිරීම; සහ,

(ආ) මහාධිකරණය විසින් ප්‍රදානය කරන ලද ක්‍රියා විරහිත කිරීමේ නියෝගයක් දීර්ඝ කළ හැකි උපරිම කාලසීමාව සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම,

වේ.

***7 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 4ඇ වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර, එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ ක්‍රියා විරහිත කිරීමේ නියෝගයක් මගින් බලපෑමට ලක්ව ඇති යම් තැනැත්තකු විසින්, අධිකරණයේ නියෝගයකට යටත්ව, නීත්‍යානුකූල ගනුදෙනු පවත්වාගෙන යාම සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම වේ.

***8 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 4ඈ වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර, එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ ක්‍රියා විරහිත කිරීමේ නියෝගයකට යටත් කර ඇති අරමුදල් ආදිය සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ප්‍රතිග්‍රාහකයකු හෝ විශේෂ කළමනාකරුවකු පත් කිරීම සම්බන්ධයෙන් හෝ අපරාධයකින් උත්පාදිත දේ කළමනාකරණය කිරීමේ අධිකාරිය වෙත විධානයක් නිකුත් කිරීම සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම වේ.

***9 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 4ඉ වන වගන්තිය සඳහා වැඩි පැහැදිලි කිරීමක් සිදු කිරීම පිණිස එම වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

***10 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 4ඊ වන වගන්තිය සඳහා වැඩි පැහැදිලි කිරීමක් සිදු කිරීම පිණිස එම වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

***11 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 4ඌ වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර, එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ රාජසන්තක කර ඇති වත්කම් ආදිය බැහැර කිරීම සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම වේ.

***12 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 4ඒ සහ 4ඔ යන අලුත් වගන්ති ඇතුළත් කරනු ලබන අතර, එම අලුත් වගන්තිවල නීතිය බලපෑම වනුයේ -

(අ) විමර්ශනයක් සිදු කිරීමේ දී භාවිත කරනු ලැබිය යුතු විශේෂ විමර්ශන ක්‍රමවේද; සහ

(ආ) විමර්ශන කාර්ය සඳහා හවුල් විමර්ශන කණ්ඩායමක් පිහිටුවීම,

පිළිබඳව විධිවිධාන සැලැස්වීම වේ.

***13 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සඳහා වැඩි පැහැදිලි කිරීමක් සිදු කිරීම පිණිස එම වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

***14 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සඳහා වැඩි පැහැදිලි කිරීමක් සිදු කිරීම පිණිස එම වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

***15 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර, එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ වූ වැරදි විමර්ශනය කිරීම ආදියේ දී සහාය ලබා දීමේ දී 2002 අංක 25 දරන සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනත අදාළ කර ගැනීම සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම වේ.

***16 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 16අ වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ ප්‍රධාන ප්‍රඥප්තියේ ඇතැම් යෙදුම්වල අර්ථ නිරූපණ සංශෝධනය කිරීම සහ ඇතැම් යෙදුම් සඳහා අලුත් අර්ථ නිරූපණ ඇතුළත් කිරීම වේ.

# ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති (සංශෝධන)

එල්. ඩී.-ඕ. 42/2021

## 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

**1.** මේ පනත 2026 අංක       දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2005 අංක 25 දරන පනතට කරනු ලබන සාමාන්‍ය සංශෝධනය

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත, මේ පනතේ උපලේඛනයේ *I වන තීරයේ* නිශ්චිතව දක්වා ඇති වගන්තිවල ඒ උපලේඛනයේ *II වන තීරයේ* අනුරූපී සටහනේ නිශ්චිතව දක්වා ඇති වචන වෙනුවට ඒ උපලේඛනයේ *III වන තීරයේ* අනුරූපී සටහනේ නිශ්චිතව දක්වා ඇති වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 2අ වන වගන්තිය සංශෝධනය කිරීම

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 2අ වන වගන්තිය, එම වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(2) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ විධිවිධානවල පටහැනිව කුමක් සඳහන් වුව ද, එය නොතකා -

- (අ) ශ්‍රී ලංකාවේ දී;
- (ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියකුට එරෙහිව;
- (ඇ) ශ්‍රී ලංකාවේ ආණ්ඩුවේ පහසුකමකට එරෙහිව; හෝ
- (ඈ) ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට යම් ක්‍රියාවක් කිරීමට හෝ කිරීමෙන් වැළකී සිටීමට බල කිරීමේ උත්සාහයක නිරත වීමේ දී,

PL 15733 - 342 (2026/04)

ත්‍රස්තවාදී ක්‍රියාවක් හෝ ත්‍රස්තවාදී ක්‍රියා එකකට වැඩි ගණනක් සිදු කිරීම මෙහෙයවනු ලබන්නා වූ හෝ ත්‍රස්තවාදී ක්‍රියාවක් හෝ ත්‍රස්තවාදී ක්‍රියා එකකට වැඩි ගණනක් සිදු කිරීම එහි ප්‍රතිඵලය වන්නා වූ, මේ පනත යටතේ වරදක් සංස්ථාපනය වන යම් ක්‍රියාවක්, සම්පූර්ණයෙන් හෝ කොටසක් ශ්‍රී ලංකාවේ පිටත දී සිදු කරනු ලබන තැනැත්තකු සම්බන්ධයෙන් මේ පනතේ විධිවිධාන අදාළ වන්නේ ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4**. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ අතුරු විධානය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අතුරු විධානය ආදේශ කිරීමෙන් :-

“එසේ වුව ද, යම් ක්‍රියාවක් මගින් ඉහත දක්වා ඇති වරදක් සංස්ථාපනය වීම සඳහා, සපයන ලද හෝ එකතු කරන ලද අරමුදල්, දේපළ නැතහොත් වෙනත් වත්කම්, ද්‍රව්‍යමය ආධාර හෝ සම්පත් සත්‍ය වශයෙන් ම වරදක් සිදු කිරීම සඳහා භාවිත කර ඇති බව හෝ නිශ්චිත ත්‍රස්තවාදී ක්‍රියාවකට සම්බන්ධිත බව පෙන්වීම අවශ්‍ය නොවන්නේ ය.”;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ -

(අ) (ආ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

“(ආ) ත්‍රස්තවාදී ක්‍රියාවකට, ත්‍රස්තවාදියකුට, ත්‍රස්තවාදීන්ට හෝ ත්‍රස්තවාදී සංවිධානවලට මුදල් සැපයීමේ වරදක් සිදු කිරීමට ආධාර හෝ අනුබල දෙන;”; සහ

(ආ) (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේද ඇතුළත් කිරීමෙන්:-

"(ආඅ) ත්‍රස්තවාදී ක්‍රියාවකට, ත්‍රස්තවාදියකුට, ත්‍රස්තවාදීන්ට හෝ ත්‍රස්තවාදී සංවිධානවලට මුදල් සැපයීමේ වරදක් සිදු කිරීමට හෝ එවැනි වරදක් සිදු කිරීමට තැත් කිරීමට වෙනත් තැනැත්තන් සංවිධානය කරන සහ මෙහෙයවන;

(ආආ) ත්‍රස්තවාදී ක්‍රියාවකට, ත්‍රස්තවාදියකුට, ත්‍රස්තවාදීන්ට හෝ ත්‍රස්තවාදී සංවිධානවලට මුදල් සැපයීමේ වරදක දී අපරාධ සහායකයකු ලෙස සහභාගී වන;

(ආඇ) ත්‍රස්තවාදී ක්‍රියාවකට, ත්‍රස්තවාදියකුට, ත්‍රස්තවාදීන්ට හෝ ත්‍රස්තවාදී සංවිධානවලට මුදල් සැපයීමේ වරදක් සිදු කිරීමට හෝ සිදුකිරීමට තැත් කිරීමට දායක වන; හෝ";

(3) එම වගන්තියේ (2අ) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

"(2ආ) යම් අරමුදල්, දේපළ නැතහොත් වෙනත් වත්කම්, ද්‍රව්‍යමය ආධාර හෝ සම්පත්, පහත දැක්වෙන යම් කාර්යයක නියැලෙන තැනැත්තන්ට මුදල් සැපයීම සඳහා භාවිත කරනු ලබන බව හෝ භාවිත කිරීමට ඉඩ ඇති බව දනිමින් හෝ ඒ බවට විශ්වාස කිරීමට හේතු සහිතව නීතිවිරෝධී ලෙස සහ හිතාමතාම, සෘජුව ම හෝ වක්‍ර ආකාරයකින් ඒ අරමුදල්, දේපළ නැතහොත් වෙනත් වත්කම්, ද්‍රව්‍යමය ආධාර හෝ සම්පත් වෙනත් තැනැත්තකුගෙන් එකතු කරන හෝ එකතු කිරීමට කුමන්ත්‍රණය කරන හෝ ඒ අරමුදල්, දේපළ

නැතහොත් වෙනත් වත්කම්, ද්‍රව්‍යමය ආධාර හෝ සම්පත් වෙනත් තැනැත්තකුට සපයන හෝ සැපයීමට කුමන්ත්‍රණය කරන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදු කරන්නේ ය :-

(අ) ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත ත්‍රස්තවාදී ක්‍රියාවක් සිදු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ දී ත්‍රස්තවාදී පුහුණුව සිදු කිරීමේ කාර්යය සඳහා හෝ ත්‍රස්තවාදී පුහුණුව ලබා දීමට හෝ ලබා ගැනීමට සැලසුම් කිරීමේ කාර්යය සඳහා හෝ සූදානම් වීමේ කාර්යය සඳහා හෝ සහභාගී වීමේ කාර්යය සඳහා;

(ආ) ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත ත්‍රස්තවාදී ක්‍රියාවක් සිදු කිරීමට වෙනත් රාජ්‍යයකට හෝ දේශභූමියකට සංචාරය කිරීම සඳහා හෝ සංචාරය කිරීමට උත්සාහ කිරීම සඳහා;

(ඇ) විදේශීය ත්‍රස්තවාදී සටන්කරුවකු බවට පත්වීම සඳහා වෙනත් රාජ්‍යයකට හෝ දේශභූමියකට සංචාරය කිරීම සඳහා හෝ සංචාරය කිරීමට උත්සාහ කිරීම සඳහා;

(ඈ) පහත දැක්වෙන යම් කාර්යයක් සඳහා වෙනත් රාජ්‍යයකට හෝ දේශභූමියකට සංචාරය කිරීම සඳහා හෝ සංචාරය කිරීමට උත්සාහ කිරීම සඳහා:-

(i) ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත ත්‍රස්තවාදී ක්‍රියාවක් සිදු කිරීමේ, සැලසුම් කිරීමේ හෝ සූදානම් වීමේ හෝ එවැනි ක්‍රියාවකට සහභාගී වීමේ කාර්යය සඳහා;

(ii) එක් රාජ්‍යයක හෝ දේශභූමියක ත්‍රස්තවාදී පුහුණුව ලබා දීමට හෝ ලබා ගැනීමට ද, ඒ රාජ්‍යයේ හෝ දේශභූමියේ හෝ වෙනත් රාජ්‍යයක හෝ දේශභූමියක යම් ත්‍රස්තවාදී සංවිධානයකට සේවය සැපයීමට හෝ සටන් වැදීමට ද, සැලසුම් කිරීමේ, සූදානම් වීමේ, හෝ සහභාගී වීමේ කාර්යය සඳහා;

(iii) සන්නද්ධ ගැටුම් ඇතුළුව සහ සන්නද්ධ ගැටුම් සම්බන්ධයෙන් හෝ ඒ සන්නද්ධ ගැටුම් ආශ්‍රිතව ඇති තර්ජනය ආමන්ත්‍රණය කිරීම සඳහා වන යම් විසඳුමක් සම්බන්ධයෙන් ත්‍රස්තවාදී පුහුණුව ලබා දීමේ හෝ ලබා ගැනීමේ කාර්යය සඳහා;

(iv) ත්‍රස්තවාදී ක්‍රියාවක් සිදු කිරීමට, සැලසුම් කිරීමට හෝ එවැනි ක්‍රියාවකට සූදානම් වීමට හෝ සහභාගී වීමට හෝ ත්‍රස්තවාදී පුහුණුව ලබා දීමේ හෝ ලබා ගැනීමේ කාර්යය සඳහා ස්වකීය පදිංචි රාජ්‍යය හෝ ජාතිකත්වය ඇති රාජ්‍යය නොවන වෙනත් රාජ්‍යයකට සංචාරය කරන්නා වූ හෝ සංචාරය කිරීමට උත්සාහ කරන්නා වූ තැනැත්තන් හිතාමතාම බඳවා ගැනීමේ, සංවිධානය කිරීමේ, ප්‍රවාහනය කිරීමේ හෝ සන්නද්ධ කිරීමේ කාර්යය සඳහා; හෝ

(v) ත්‍රස්තවාදී ක්‍රියාවක් සිදු කිරීමට, සැලසුම් කිරීමට හෝ එවැනි ක්‍රියාවකට සූදානම් වීමට හෝ සහභාගී වීමට නැතහොත් ත්‍රස්තවාදී පුහුණුව ලබා දීමේ හෝ ලබා

ගැනීමේ කාර්යය සඳහා ස්වකීය පදිංචි රාජ්‍යය හෝ ජාතිකත්වය ඇති රාජ්‍ය නොවන වෙනත් රාජ්‍යයකට සංචාරය කරන්නා වූ හෝ සංචාරය කිරීමට උත්සාහ කරන්නා වූ තැනැත්තන් බඳවා ගැනීමේ ක්‍රියාවක් ඇතුළුව චේතනාන්විතව සංවිධානය කිරීමේ හෝ වෙනත් පහසුකම් සැලසීමේ කාර්යය සඳහා; හෝ

(ඉ) ත්‍රස්තවාදී පුහුණුව සඳහා පුද්ගල ජාවාරමෙහි නියැලීම සඳහා.'';

(4) එම වගන්තියේ (3) වන උපවගන්තියේ, ''මේ වගන්තියේ (1) වන උපවගන්තියේ, (2) වන උපවගන්තියේ හෝ (2අ) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති'' යන වචන සහ ඉලක්කම් වෙනුවට ''මේ වගන්තියේ (1) වන උපවගන්තියේ, (2) වන උපවගන්තියේ, (2අ) වන උපවගන්තියේ හෝ (2ආ) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(5) එම වගන්තියේ (4) වන උපවගන්තියේ ''මේ වගන්තියේ (1) වන උපවගන්තිය, (2) වන උපවගන්තිය හෝ (2අ) වන උපවගන්තිය යටතේ'' යන වචන සහ ඉලක්කම් වෙනුවට, ''මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ, (2) වන උපවගන්තිය යටතේ, (2අ) වන උපවගන්තිය යටතේ හෝ (2ආ) වන උපවගන්තිය යටතේ'' යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් සහ ''සහ දඩයකට ද යටත් වන්නේ ය.'' යන වචන වෙනුවට ''හෝ රුපියල් මිලියන සියයක් නොඉක්මවන දඩයකට හෝ එකී බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකට ම හෝ යටත් වන්නේ ය.''.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම**

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ “3 වන වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින්” යන වචන සහ ඉලක්කම වෙනුවට “3 වන වගන්තිය යටතේ වන ක්‍රියාවක් සිදු කිරීමෙන්” යන වචන සහ ඉලක්කම ආදේශ කිරීමෙන්; සහ

(2) එම වගන්තියේ (3) වන උපවගන්තියේ “දින හතක” යන වචන වෙනුවට “වැඩ කරන දින දාහතරක” යන වචන ආදේශ කිරීමෙන්.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 4අ වන වගන්තිය සංශෝධනය කිරීම**

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 4අ වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ “දින හත” සහ “දින හතක” යන වචන වෙනුවට, පිළිවෙළින් “වැඩ කරන දින දාහතර” සහ “වැඩ කරන දින දාහතරක” යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ පළමුවන අතුරු විධානයේ “මාස තුනක්” යන වචන වෙනුවට, “මාස හයක්” යන වචන ආදේශ කිරීමෙන්.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 4ඇ වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම**

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 4ඇ වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

“මහාධිකරණය විසින් අත්‍යවශ්‍ය සහ නීත්‍යානුකූල ගනුදෙනු සඳහා අවසර ලබාදිය හැකි බව.

**4ඇ.** (1) ක්‍රියා විරහිත කිරීමේ නියමයක් බලපාන්නා වූ යම් තැනැත්තකුගේ නීත්‍යානුකූල ව්‍යාපාරයකට හෝ වෙනත් යම් සම්බන්ධතාවලට පනවන ලද තහනම් කිරීම මගින් හානියක් සිදු විය හැකි අවස්ථාවක දී, එවැනි යම් තැනැත්තකු විසින් කරනු ලබන ඉල්ලීම

තහවුරු කරන යම් කරුණු සඳහන් කරමින් මහාධිකරණය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) එවැනි සෑම ඉල්ලීමක්මක් ම, මහාධිකරණය ආමන්ත්‍රණය කරමින් ලිඛිත පෙත්සමක් මගින් කරනු ලැබිය යුතු අතර, එය 2025 අංක 5 දරන අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනතේ 127 වන වගන්තියෙහි දක්වා ඇති කාර්යපටිපාටියට අනුකූලව විභාග කර තීරණය කරනු ලැබිය යුතු ය.

(3) මහාධිකරණය විසින් ඒ ඉල්ලීම සලකා බැලීමෙන් පසුව, ඒ තැනැත්තාගේ නීත්‍යානුකූල ව්‍යාපාරයකට හෝ වෙනත් යම් සම්බන්ධතාවලට ඒ ක්‍රියා විරහිත කිරීමේ නියමය මගින් හානි සිදුවිය හැකි බව සහ තහනම් කිරීමට යටත්ව ඇති අරමුදල්වලට, දේපළවලට හෝ වෙනත් වත්කම්වලට, ආදායම්වලට, ලාභවලට හෝ උපකරණවලට අදාළ යම් අත්‍යවශ්‍ය ගනුදෙනු නීත්‍යානුකූල ලෙස සිදු කළ හැකි බවට අධිකරණයේ මතය වේ නම්, 4 වන වගන්තිය යටතේ කරන ලද ක්‍රියා විරහිත කිරීමේ නියමය තහවුරු කරනු ලැබිය හැකි අතර-

(අ) මහාධිකරණයේ අධීක්ෂණයට යටත්ව; සහ

(ආ) 4ඈ වන වගන්තිය යටතේ ඒ අරමුදල්වල, දේපළවල හෝ වෙනත් වත්කම්වල, ආදායම්වල, ලාභවල හෝ උපකරණවල සන්තකය භාර ගැනීම සඳහා ප්‍රතිග්‍රාහකයකු හෝ විශේෂ කළමනාකරුවකු පත්කර ඇති අවස්ථාවක දී ඒ විශේෂ කළමනාකරුගේ හෝ ප්‍රතිග්‍රාහකයාගේ අධීක්ෂණයට යටත්ව නැතහොත්

අපරාධයකින් උත්පාදිත දේ කළමනාකරණය කිරීමේ අධිකාරිය වෙත විධානයක් කර ඇති අවස්ථාවක දී, අපරාධයකින් උත්පාදිත දේ කළමනාකරණය කිරීමේ අධිකාරියේ අධීක්ෂණයට යටත්ව අවස්ථාවෝචිත පරිදි,

ඒ ගනුදෙනු කරගෙන යාම සඳහා අවසර දෙමින් තවදුරටත් ආඥාවක් කරනු ලැබිය හැකි ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 4ඇ වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

**8**. ප්‍රධාන ප්‍රඥප්තියේ 4ඇ වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

“ක්‍රියා විරහිත කිරීමෙන් පසුව ප්‍රතිග්‍රාහකයකු ආදිය පත් කිරීම.

**4ඇ**. මහාධිකරණය විසින් තත්කාර්ය සම්බන්ධයෙන් සහකාර පොලිස් අධිකාරීවරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන යම් පොලිස් නිලධරයකු විසින් කරන ලද ඉල්ලීමකින් පසුව හෝ ස්වකීය මෙහෙයවීමෙන් ම, ක්‍රියා විරහිත කිරීමේ නියමයකට යටත් වී තිබෙන අරමුදල්වල, දේපළවල හෝ වෙනත් වත්කම්වල, ආදායම්වල, ලාභවල හෝ උපකරණවල සන්තකය භාර ගැනීම සඳහා හෝ ඒවා සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් කටයුතු කිරීම සඳහා 2025 අංක 5 දරන අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනතේ IV වන කොටස ප්‍රකාරව-

(අ) ප්‍රතිග්‍රාහකයකු හෝ විශේෂ කළමනාකරුවකු පත් කරනු ලැබිය හැකි ය; හෝ

(ආ) අපරාධයකින් උත්පාදිත දේ කළමනාකරණය කිරීමේ අධිකාරිය වෙත විධාන කරනු ලැබිය හැකි ය.”.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 4ඉ වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 4ඉ වන වගන්තිය සංශෝධනය කිරීම

(1) එම උපවගන්තියේ (අ) ඡේදයේ (i) වන අනුඡේදය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන්:-

"(i) එම අරමුදල්, දේපළ හෝ වෙනත් වත්කම්, ආදායම, ලාභ හෝ උපකරණ අනාවරණය කර ගැනීම, සොයා යාම, හඳුනා ගැනීම, තිබෙන ස්ථානය සොයා ගැනීම හෝ ප්‍රමාණීකරණය;"; සහ

(2) එම උපවගන්තියේ (ආ) ඡේදය ඉවත්කර, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

"(ආ) අධිකරණය විසින් විධානය කරනු ලැබිය හැකි පරිදි ඒ ආඥාවේ නම් කළ යම් ආයතනයක් විසින්, ක්‍රියා විරහිත කිරීමේ නියමයේ දිනයට පෙර හෝ පසු කාලසීමාව තුළ ඒ අරමුදල්වලට, දේපළවලට හෝ වෙනත් වත්කම්වලට, ආදායම්වලට, ලාභවලට හෝ උපකරණවලට අදාළව ඒ ආයතනය විසින් ලබාගත් සියලු ලේඛන සහ තොරතුරු හෝ ඒ අරමුදල්වලට, දේපළවලට හෝ වෙනත් වත්කම්වලට, ආදායම්වලට, ලාභවලට හෝ උපකරණවලට අදාළව ඒ ආයතනය විසින් කරන ලද යම් ව්‍යාපාරික ගනුදෙනු සම්බන්ධයෙන් සියලු ලේඛන සහ තොරතුරු එම පොලිස් නිලධරයා වෙත සැපයිය යුතු බවට,".

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 4ඊ වන වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "3 වන වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින්" යන වචන සහ ඉලක්කම වෙනුවට "3 වන වගන්තිය යටතේ වන ක්‍රියාවක් සිදු කිරීමෙන්" යන වචන සහ ඉලක්කම ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 4ඊ වන වගන්තිය සංශෝධනය කිරීම

ප්‍රධාන ප්‍රඥප්තියේ 4ඌ වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 4ඌ වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :-

"රාජසන්තක කිරීමෙන් පසු ප්‍රතිග්‍රාහකයකු ආදිය පත් කිරීම.

**4ඌ.** යම් අරමුදලක්, දේපළක්, වෙනත් වත්කමක්, ආදායමක්, ලාභ හෝ උපකරණයක් මේ පනතේ 4ඊ වන වගන්තිය යටතේ රාජසන්තක කර තිබෙන අවස්ථාවක, ඒ රාජසන්තක කිරීමේ ආඥාව කරනු ලබන අධිකරණය විසින් එසේ රාජසන්තක කරනු ලැබූ ඒ අරමුදල්, දේපළ හෝ වෙනත් වත්කම්, ආදායම, ලාභ හෝ උපකරණය බැහැර කිරීම සඳහා 4ඇ වන වගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි, අවස්ථාවෝචිත පරිදි, ප්‍රතිග්‍රාහකයකු හෝ විශේෂ කළමනාකරුවකු පත් කිරීම හෝ අපරාධයකින් උත්පාදිත දේ කළමනාකරණය කිරීමේ අධිකාරිය වෙත විධාන කිරීම හෝ කරනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියට 4ඒ සහ 4ඔ යන අලුත් වගන්ති ඇතුළත් කිරීම

**12**. ප්‍රධාන ප්‍රඥප්තියේ 4එ වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එම වගන්ති එම ප්‍රඥප්තියේ 4ඒ සහ 4ඔ යන වගන්ති ලෙස බලාත්මක විය යුතු ය:-

"විමර්ශනයක් සිදු කිරීමේ දී භාවිත කළ යුතු විශේෂ විමර්ශන ක්‍රමවේද.

**4ඒ.** (1) මේ පනත යටතේ විමර්ශනයක් සිදු කරන යම් පොලිස් නිලධරයකු විසින්, විමර්ශනය සිදු කිරීමේ දී, වෙනත් යම් ලිඛිත නීතියකින් එම පොලිස් නිලධරයා වෙත පැවරී ඇති බලතලවලට අමතරව, පහත දැක්වෙන ක්‍රමවේද ද ඇතුළුව යම් විමර්ශන ක්‍රමවේද භාවිත කරනු ලැබිය හැකි ය:-

(අ) ආවේක්ෂණය සහ නිරීක්ෂණය;

(ආ) ආවරණ මෙහෙයුම්;

(ඇ) වීඩියෝ පටිගත කිරීම;

(ඈ) සවන්දීමේ උපාංග භාවිත කිරීම;

(ඉ) පාලනය කරන ලද භාරදීම්; හෝ

(ඊ) පරිගණක දත්ත සහ පරිගණක පද්ධති වෙත ප්‍රවේශ වීම.

(2) සහකාර පොලිස් අධිකාරීවරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන පොලිස් නිලධරයකු විසින්, (1) වන උපවගන්තියේ (ඇ), (ඈ), (ඉ) සහ (ඊ) ඡේදවල කාර්ය සඳහා ආඥාවක් ලබාගැනීම පිණිස ප්‍රමාණවත් කරුණු ද සමග ඒකපාර්ශ්වික ඉල්ලීමක් රහසිගතව මහෙස්ත්‍රාත් අධිකරණය වෙත කරනු ලැබිය හැකි ය.

(3) මේ පනත යටතේ විමර්ශන සිදු කරන නිලධරයකුට යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ වන වරදක් සිදුකර ඇති බවට හෝ සිදු කරමින් සිටින බවට හෝ සිදු කිරීමට ආසන්න බවට සැක කිරීමට හෝ විශ්වාස කිරීමට සාධාරණ හේතු පවතින්නේ නම්, යම් ක්‍රියාකලාපයක් රහසිගත ලෙස නිරීක්ෂණය කිරීම සහ යම් සන්නිවේදනයක් පටිගත කිරීම සඳහා බලය දෙන වරෙන්තුවක් ලබාගැනීම සඳහා වන ලිඛිත ඉල්ලීමක් සහකාර පොලිස් අධිකාරීවරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන පොලිස් නිලධරයකු විසින්, මහෙස්ත්‍රාත්වරයා වෙත කරනු ලැබිය හැකි ය.

(4) විමර්ශනය සිදු කරන නිලධරයා විසින් ලබාගත් හෝ රැස්කර ගත් තොරතුරු ආරක්ෂා කිරීම සහ සංරක්ෂණය කිරීම සඳහා වගබලා ගැනීම (2) වන උපවගන්තිය යටතේ ඉල්ලීම කරන නිලධරයාගේ කාර්යය විය යුතු ය.

හවුල් විමර්ශන කණ්ඩායමක් පිහිටුවීම.

**4ඔ.** (1) සිද්ධියට අදාළ අවස්ථානුගත කරුණු අනුව එසේ කිරීම සාධාරණීකරණය කෙරෙන අවස්ථාවක-

(අ) 3 වන වගන්තිය යටතේ වන වරදක්; හෝ

(ආ) ශ්‍රී ලංකාවෙන් පිටත යම් අධිකරණ බල සීමාවක් තුළ සිදු කරන ලදැයි චෝදනා කරනු ලබන, එම අධිකරණ බල සීමාව තුළ 3 වන වගන්තියේ සඳහන් වරදකට අනුරූප වරදක් සංයුක්ත වන නැතහොත් ශ්‍රී ලංකාව තුළ සිදු කරනු ලැබුවේ නම් 3 වන වගන්තියේ සඳහන් වරදක් සංයුක්ත වන ක්‍රියාවක්,

සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කිරීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකා පොලිසිය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි, ශ්‍රී ලංකා පොලිසිය සහ ශ්‍රී ලංකාව තුළ හෝ වෙනත් යම් අධිකරණ බල සීමාවක් තුළ විමර්ශන සිදු කිරීමේ බලය ඇති වෙනත් යම් අධිකාරියක් අතර ඇති කරගනු ලැබූ එකඟතාවයක් මගින් යම් නිශ්චිත කාලසීමාවක් සඳහා හවුල් විමර්ශන කණ්ඩායමක් පිහිටුවනු ලැබිය හැකි ය.

(2) විමර්ශනයට භාජනය කරන ලද තැනැත්තන්ට විරුද්ධව අධිකරණය ඉදිරියෙහි නඩු විභාග කරනු ලබන අවස්ථාවක දී, හවුල් විමර්ශනයක දී ලබාගත් යම් සාක්ෂියක් හෝ කරුණක් එම අධිකරණය විසින් භාවිත කරනු ලැබිය හැකි ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම

**13**. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ “3 වන වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින්” යන වචන සහ ඉලක්කම වෙනුවට “3 වන වගන්තිය යටතේ වන ක්‍රියාවක් සිදු කිරීමෙන්” යන වචන සහ ඉලක්කම ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියේ “අමාත්‍යවරයා” යන වචනය වෙනුවට “ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන ව්‍යවස්ථාව හෝ 45 වන ව්‍යවස්ථාව ප්‍රකාරව විදේශ කටයුතු විෂයය පවරන ලද අමාත්‍යවරයා” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

“රටවලට හෝ අන්තර් රාජ්‍ය සංවිධානවලට සහාය වීම.

**9.** මේ පනත යටතේ වන වැරදි සම්බන්ධයෙන් විමර්ශනය කිරීමේ දී, නඩු පැවරීමේ දී, රාජසන්තක කිරීමේ දී හෝ ආඥා බලාත්මක කිරීමේ දී හෝ වෙනත් යම් නඩු කටයුත්තක දී 2002 අංක 25 දරන සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනතේ විධිවිධාන ශ්‍රී ලංකාවේ ආණ්ඩුව සහ යම් නිශ්චිත රටක් හෝ නිශ්චිත සංවිධානයක් අතර සහයෝගීතාව පවත්වා ගැනීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 16අ වන වගන්තිය සංශෝධනය කිරීම

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 16අ වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) “මූල්‍ය ව්‍යාපාරය” යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කිරීමෙන්;

(2) “අරමුදල් හෝ දේපළ” යන යෙදුමේ අර්ථ නිරූපණයට පෙරාතුව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණ ඇතුළත් කිරීමෙන් :-

““සන්නද්ධ ගැටුම” යන්නෙන්, රාජ්‍යයන්හි සන්නද්ධ හමුදා අතර (ජාත්‍යන්තර සන්නද්ධ ගැටුම), හෝ රාජ්‍ය අධිකාරයන් සහ සංවිධානාත්මක සන්නද්ධ

කණ්ඩායම් අතර හෝ රාජ්‍යයක් තුළ එවැනි කණ්ඩායම් අතර (ජාත්‍යන්තර නොවන සන්නද්ධ ගැටුම) සන්නද්ධ ගැටුමක් පැවතීම අදහස් වේ;

“පරිගණක දත්ත” යන්නෙන්, පරිගණක පද්ධතියක් මගින් යම් කර්තව්‍යයක් කිරීමට සැලැස්වීම සඳහා සුදුසු වැඩසටහනක් ද ඇතුළුව, පරිගණක පද්ධතියක් තුළ සැකසීම සඳහා සුදුසු ආකාරයකින් කරුණු, තොරතුරු හෝ සංකල්ප නිරූපණය කිරීමක් අදහස් වේ;

“පරිගණක පද්ධතිය” යන්නට, 2007 අංක 24 දරන පරිගණක අපරාධ පනතේ ඊට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

“විදේශීය ත්‍රස්තවාදී සටන්කරුවා” යන්නෙන්, ත්‍රස්තවාදී ක්‍රියාවක් සිදු කිරීම, සැලසුම් කිරීම හෝ එවැනි ක්‍රියාවකට සූදානම් වීම හෝ සහභාගී වීම යන කාර්යය සඳහා හෝ ත්‍රස්තවාදී පුහුණුව ලබා දීමේ හෝ ලබා ගැනීමේ කාර්යය සඳහා -

(අ) ස්වකීය පදිංචිය හෝ ජාතිකත්වය ඇති රාජ්‍යයෙන් හෝ දේශභූමියෙන් වෙනත් රාජ්‍යයකට හෝ දේශභූමියකට සංචාරය කරන්නා වූ හෝ සංචාරය කිරීමට උත්සාහ කරන්නා වූ; හෝ

(ආ) ස්වකීය පදිංචිය හෝ ජාතිකත්වය ඇති රාජ්‍යය හෝ දේශභූමිය හෝ නොවන, එක් රාජ්‍යයක හෝ දේශභූමියක සිට වෙනත් රාජ්‍යයකට හෝ දේශභූමියකට සංචාරය

කරන්නා වූ හෝ සංචාරය කිරීමට උත්සාහ කරන්නා වූ,

පුද්ගලයකු අදහස් වේ;”;

(3) “අරමුදල් හෝ දේපළ” යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත්කර, ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන්:-

““අරමුදල්, දේපළ හෝ වෙනත් වත්කම්” යන්නෙන්-

(අ) බැංකු ණය, සංචාරක චෙක්පත්, බැංකු චෙක්පත්, මුදල් ඇණවුම්, කොටස්, සුරැකුම්පත්, බැඳුම්කර, අණකර, ණයවර ලිපි සහ අතථ්‍ය වත්කම් ඇතුළුව එහෙත් ඒවාට සීමා නොවූ නීත්‍යානුකූලව හෝ නීතිවිරෝධීව අත්පත් කර ගන්නා ලද යම් ව්‍යවහාර මුදල්;

(ආ) (i) භෞතික හෝ අභෞතික, චංචල හෝ නිශ්චල, ස්පර්ශ කළ හැකි හෝ ස්පර්ශ කළ නොහැකි;

(ii) ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත තබා ඇති හෝ පිහිටා ඇති,

නීත්‍යානුකූලව හෝ නීතිවිරෝධීව අත්පත්කර ගන්නා ලද යම් දේපළක්; හෝ

(ඇ) අරමුදල්, භාණ්ඩ හෝ සේවා රැස් කිරීමට භාවිත කළ හැකි යම් ආර්ථික සම්පතක් හෝ වෙනත්

වත්කමක් ඇතුළුව නීත්‍යානුකූලව හෝ නීතිවිරෝධීව අත්පත්කර ගන්නා ලද යම් වෙනත් වත්කම්,

අදහස් වන අතර, ඊට ඒ අරමුදල්වල, දේපළවල හෝ වෙනත් වත්කම්වල අයිතිය හෝ සම්බන්ධතාවය සනාථ කරන්නා වූ ඉලෙක්ට්‍රොනික හෝ ඩිජිටල් ආකාරයකින් ඇතුළුව ඕනෑම ආකාරයක යම් නෛතික ලේඛනයක් හෝ සාධන පත්‍රයක් සහ එම අරමුදල්වලින්, දේපළවලින් හෝ වෙනත් වත්කම්වලින් උපචිත වන හෝ උපදවනු ලබන යම් පොළියක්, ලාභාංශයක් හෝ වෙනත් ආදායමක් හෝ වටිනාකමක් හෝ ඒ අරමුදල්, දේපළ හෝ වෙනත් වත්කම් භාවිතයෙන් කරන ලද ආයෝජන ඇතුළත් වේ;";

(4) "අරමුදල්, දේපළ හෝ වෙනත් වත්කම්" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් :-

"“ශ්‍රී ලංකා ආණ්ඩුවේ පහසුකම” යන්නෙන්, ආණ්ඩුවේ, ආණ්ඩුවේ නැතහොත් පළාත් සභාවක යම් අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක, පළාත් පාලන ආයතනයක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක, රාජ්‍ය සංස්ථාවක, බැංකුවක, තානාපති කාර්යාලයක, රාජ්‍යතාන්ත්‍රික හෝ කොන්සියුලර් පරිශ්‍රයක දේපළක් හෝ වෙනත් යම් රටක ඇති ශ්‍රී ලංකා ආණ්ඩුවේ වෙනත් දේපළක් අදහස් වේ;";

(5) "ආයතනය" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන්:-

"""ආයතනය" යන්නට, 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ ඊට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;";

(6) "තැනැත්තා" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත්කර, ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන්:-

"""තැනැත්තා" යන්නෙන්, යම් ස්වාභාවික හෝ නෛතික තැනැත්තකු අදහස් වන අතර, ඊට ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කළ හෝ සංස්ථාගත නොකළ පුද්ගල මණ්ඩලයක් ද නෛතික පුද්ගලභාවයක් ඇති හෝ නොමැති නෛතික වැඩපිළිවෙලක් ද එම තැනැත්තාගේ හෝ පුද්ගල මණ්ඩලයේ ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද හෝ පිහිටුවන ලද ශාඛාවක් ද ඇතුළත් වේ;

(7) "තැනැත්තා" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණ ඇතුළත් කිරීමෙන් :-

"""අපරාධයකින් උත්පාදිත දේ කළමනාකරණය කිරීමේ අධිකාරිය" යන්නෙන්, 2025 අංක 5 දරන අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනතේ විධිවිධාන ප්‍රකාරව පිහිටුවන ලද අපරාධයකින් උත්පාදිත දේ කළමනාකරණය කිරීමේ අධිකාරිය අදහස් වේ;

"විශේෂ කළමනාකරු" යන්නෙන්, 2025 අංක 5 දරන අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනතේ විධිවිධාන ප්‍රකාරව

මහාධිකරණය විසින් පත් කරනු ලබන විශේෂ කළමනාකරුවකු අදහස් වේ;";

(8) "ත්‍රස්තවාදියා" යන යෙදුමේ අර්ථ නිරූපණයේ-

(අ) (ඇ) ඡේදයේ "අනුබලදෙන; හෝ" යන වචන වෙනුවට "අනුබල දෙන;" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) (ඈ) ඡේදයේ "සපයන," යන වචනය වෙනුවට "සපයන; හෝ" යන වචන ආදේශ කිරීමෙන්;

(ඇ) (ඈ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් :-

"(ඉ) විදේශීය ත්‍රස්තවාදී සටන්කරුවකු වන,";සහ

(9) "ත්‍රස්තවාදී ක්‍රියාව" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් :-

""අතථ්‍ය වත්කම" යන්නෙන්, ඩිජිටල් ආකාරයෙන් වෙළෙඳාම් කළ හැකි හෝ පවරනු ලැබිය හැකි වූ ද, ගෙවීම් හෝ ආයෝජන කාර්ය සඳහා භාවිත කළ හැකි වූ ද, වටිනාකම් පිළිබඳ ඩිජිටල් නිරූපණයක් අදහස් වන නමුත්, ඊට අධිකාරී මුදල්, සුරැකුම්පත් සහ වෙනත් මූල්‍ය වත්කම් පිළිබඳ යම් ඩිජිටල් නිරූපණයක් ඇතුළත් නොවේ.".

**17.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

[2 වන වගන්තිය]

## උපලේඛනය

| *I වන තීරය* | *II වන තීරය* | *III වන තීරය* |
|---|---|---|
| ප්‍රධාන ප්‍රඥප්තියේ සංශෝධනය කරනු ලබන වගන්තිය | දැනට පවතින වචන | ආදේශ කරනු ලබන වචන |
| 3(1) | යම් අරමුදල් හෝ දේපළ, | යම් අරමුදල්, දේපළ නැතහොත් වෙනත් වත්කම්, ද්‍රව්‍යමය ආධාර හෝ සම්පත් |
| | එවැනි අරමුදල් හෝ දේපල | ඒ අරමුදල්, දේපළ නැතහොත් වෙනත් වත්කම්, ද්‍රව්‍යමය ආධාර හෝ සම්පත් |
| 3(2අ) | යම් ද්‍රව්‍යමය ආධාර හෝ සම්පත් | යම් අරමුදල්, දේපළ නැතහොත් වෙනත් වත්කම්, ද්‍රව්‍යමය ආධාර හෝ සම්පත් |
| 4(1) | සියලු අරමුදල් හෝ දේපළ, එම අරමුදල් හෝ දේපළ මත | සියලු අරමුදල්, දේපළ හෝ වෙනත් වත්කම්, එම අරමුදල්, දේපළ හෝ වෙනත් වත්කම් මත |
| 4(4) | යම් අරමුදලක්, දේපළක්, | යම් අරමුදල්, දේපළ හෝ වෙනත් වත්කම්, |
| | අරමුදලේ, දේපළේ, | අරමුදල්වල, දේපළේ හෝ වෙනත් වත්කම්වල, |
| 4අ(2) දෙවන අතුරු විධානය | අරමුදල, දේපළ, ආදායම, ලාභය | අරමුදල්වලට, දේපළට හෝ වෙනත් වත්කම්වලට, ආදායමට, ලාභයට |
| 4අ(3) | අරමුදලට, දේපළට | අරමුදල්වලට, දේපළට හෝ වෙනත් වත්කම්වලට |
| 4ආ | එවැනි යම් අරමුදලකට, දේපළකට, ආදායමකට, ලාභයකට | ඒ අරමුදල්වලට, දේපළට හෝ වෙනත් වත්කම්වලට, ආදායමට, ලාභයට |

| | | |
|---|---|---|
| 4ඉ (1) | යම් අරමුදලක්, දේපළක්, | යම් අරමුදල්, දේපළ හෝ වෙනත් වත්කම්, |
| | එම අරමුදලේ, දේපළේ, | එම අරමුදල්වල, දේපළේ හෝ වෙනත් වත්කම්වල, |
| | එවැනි අරමුදලක්, දේපළක්, | එවැනි අරමුදල්, දේපළ හෝ වෙනත් වත්කම්, |
| 4ඉ(1)(අ)(ii) | එම අරමුදල්, දේපළ, ආදායම, ලාභය | එම අරමුදල්වල, දේපළේ හෝ වෙනත් වත්කම්වල, ආදායමේ, ලාභයේ |
| 4ඉ(1)(අ)(iii) | එම අරමුදල්, දේපළ, | එම අරමුදල්, දේපළ හෝ වෙනත් වත්කම්, |
| 4ඉ(3) | යම් අරමුදලක්, දේපළක්, | යම් අරමුදල්, දේපළ හෝ වෙනත් වත්කම්, |
| | ඒ අරමුදලේ, දේපළේ, | ඒ අරමුදල්වල, දේපළේ හෝ වෙනත් වත්කම්වල, |
| | එවැනි අරමුදලක්, දේපළක්, ආදායමක්, ලාභයක් හෝ උපකරණයක්, | ඒ අරමුදල්, දේපළ හෝ වෙනත් වත්කම්, ආදායම, ලාභය හෝ උපකරණය, |
| 4ඊ(1) | යම් අරමුදල් හෝ දේපළ, | යම් අරමුදල්, දේපළ හෝ වෙනත් වත්කම්, |
| | එම අරමුදල් හෝ දේපළ මත | එම අරමුදල්, දේපළ හෝ වෙනත් වත්කම් මත |
| 4ඊ(2) | එම අරමුදල්, දේපළ, ආදායම්, ලාභ | එම අරමුදල්, දේපළ හෝ වෙනත් වත්කම්, ආදායම්, ලාභ |
| | එම අරමුදල්, දේපළ, ආදායම, ලාභය | එම අරමුදල්වල, දේපළේ හෝ වෙනත් වත්කම්වල, ආදායමේ, ලාභයේ |
| 4ඊ(4) | එම අරමුදල්, දේපළ, එම අරමුදල් හෝ දේපළ මත | එම අරමුදල්, දේපළ හෝ වෙනත් වත්කම්, එම අරමුදල්, දේපළ හෝ වෙනත් වත්කම් මත |
| | එම අරමුදල්, දේපළ, ආදායම, | එම අරමුදල්, දේපළ හෝ වෙනත් වත්කම්, ආදායම, |
| 4ඊ(6) | අරමුදල්වල හෝ දේපළේ | අරමුදල්වල, දේපළේ හෝ වෙනත් වත්කම්වල |
| | එම අරමුදල් සහ දේපළ දැරීම | එම අරමුදල්, දේපළ හෝ වෙනත් වත්කම් දැරීම |
| | එම අරමුදල් හෝ දේපළ | එම අරමුදල්, දේපළ හෝ වෙනත් වත්කම් |

| | | |
|---|---|---|
| 4උ(1) | යම් අරමුදල් හෝ දේපළ හෝ එම අරමුදල් හෝ දේපළ මත | යම් අරමුදල්, දේපළ හෝ වෙනත් වත්කම් හෝ එම අරමුදල්, දේපළ හෝ වෙනත් වත්කම් මත |
| | එම අරමුදලේ, දේපළේ, | එම අරමුදල්වල, දේපළේ හෝ වෙනත් වත්කම්වල, |
| | එම අරමුදල්, දේපළ, ආදායම, | එම අරමුදල්, දේපළ හෝ වෙනත් වත්කම්, ආදායම, |
| 4උ(2) | විෂයය වූ අරමුදල, දේපළ, | විෂයය වූ අරමුදල්, දේපළ හෝ වෙනත් වත්කම්, |
| 4උ(2)(අ) | ඒ අරමුදල් හෝ දේපළ ඍජුව ම | ඒ අරමුදල්, දේපළ හෝ වෙනත් වත්කම් ඍජුව ම |
| | එම අරමුදල් හෝ දේපළ හෝ | එම අරමුදල්, දේපළ හෝ වෙනත් වත්කම් |
| 4උ(2)(ආ) | එම අරමුදල්වලට හෝ දේපළට | එම අරමුදල්වලට, දේපළට හෝ වෙනත් වත්කම්වලට |
| | එම දේපළ හෝ අරමුදල | එම අරමුදල්, දේපළ හෝ වෙනත් වත්කම් |
| 4උ(2)(ඇ) | එම අරමුදල්වලට හෝ දේපළට | එම අරමුදල්වලට, දේපළට හෝ වෙනත් වත්කම්වලට |
| | එම අරමුදල හෝ දේපළ | එම අරමුදල්, දේපළ හෝ වෙනත් වත්කම් |
| 5(1) | යම් අරමුදල් හෝ දේපළ, | යම් අරමුදල්, දේපළ හෝ වෙනත් වත්කම් |
| | එම අරමුදල් හෝ දේපළ මත | එම අරමුදල්, දේපළ හෝ වෙනත් වත්කම් මත |
| 5(2) | යම් අරමුදල්, දේපළ, | යම් අරමුදල්, දේපළ හෝ වෙනත් වත්කම්, |
| 5(3) | යම් අරමුදල්, දේපළ, | යම් අරමුදල්, දේපළ හෝ වෙනත් වත්කම්, |
| | ලත් අරමුදල්, දේපළ, | ලත් අරමුදල්, දේපළ හෝ වෙනත් වත්කම් |